---

## ගලේවෙල ප්‍රාදේශීය සභාව
## මාතලේ දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 08 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 08 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ගලේවෙල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම් ශේෂ එකිනෙකට සමාන වියයුතු වුවද, එම ගිණුම් ශේෂ අතර රු.2,306,909ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ). සභාව සතු නව වෙළඳ සංකීර්ණයේ හා සතිපොලේ කඩ කාමර ඉදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ වැය කරන ලද රු.3,892,263ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ). වටිනාකම රු.500,000ක් වූ පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල හා පැරණි පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් කර තිබුණද, එම වටිනාකම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ඈ). වර්ෂයේ මිලදී ගනු ලබන භාණ්ඩ තොගය මිලදී ගන්නා අවස්ථාවේදී වැය ශීර්ෂ හර කර වර්ෂය අවසානයේදී මිලදී ගන්නා ලද තොගය අදාල වැය ශීර්ෂ බැරකර අතැති තොග ගිණුමට මාරුකර තිබුණි. පසුව ගබඩාවෙන් නිකුත් කරන ලද වර්ෂයට අදාල තොග වටිනාකම වැය ශීර්ෂ හරකර අතැති තොග ගිණුම බැර කිරීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි. මේ හේතුවෙන් තොග ගිණුම්ගත කිරීමේ තාත්වික ක්‍රමවේදයෙන් බැහැර වී තිබුණි.

---

(ඉ). සභාව සතු ඉඩම් කැබලි 17ක හා ගොඩනැගිලි 07ක වටිනාකම් පිළිවෙලින් රු.68,946,000ක් හා රු.136,200,000ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඊ). බිල් කළ ආදායම්, ආදායම් ණයගැතියන් හරකර ආදායම් පාලන ගිණුම බැර කිරීම හා මුදල් ලැබීමේදී මුදල් හරකර අදාල ආදායම් ණයගැතියන් බැර කළයුතු වුවත්, වරිපනම්, අක්කර බදු, ජල ගාස්තු හා කඩ කුලී වෙනුවෙන් රැස්කරනු ලබන ආදායම් එක් එක් ආදායම්, මුදල් හරකර ආදායම් ගිණුම බැරකර පසුව ආදායම් ගිණුම් හරකර, හිඟහිටි ආදායම් ගිණුම බැර කිරීම හා බිල්කළ ආදායම් ප්‍රමාණයන් හිඟහිටි ආදායම් ගිණුම් හර කර එක් එක් ආදායම් පාලන ගිණුම් බැර කිරීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි.

(උ) ගිණුම් විෂයයන් 05කට අදාලව පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව හා උපයෝගී ලේඛන හා වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව අතර රු.5,066,191ක වෙනසක් පැවතුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 67,941,045ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,412,057 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,183,563 ක් විය.

2.2 බැංකු ගිණුම්

---

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි සඳහන් 2003 වර්ෂයට පෙර සිට පැවත එන රු.96,996ක් වටිනා අගරු චෙක්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i). වරිපනම් හා බදු | 1,105 | 1,073 | 512 |
| (ii). බදු කුලී | 2,995 | 2,955 | 212 |
| (iii).බලපත්‍ර ගාස්තු | 2,405 | 2,007 | 691 |
| (iv).වෙනත් ආදායම් | 38,765 | 33,559 | 12,146 |

2.3.2 වරිපනම් හා බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය අනුව හිඟහිටි වරිපනම් හා අක්කර බදු අයකිරීම සම්බන්ධයෙන් කටයුතු නොකිරීම නිසා ඉකුත් වර්ෂය හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් අයවිය යුතු වරිපනම් බදු රු.208,930ක හා අක්කර බදු රු.40,057ක හිඟ ශේෂයන් පැවතුණි.

2.3.3 බදු කුලී

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා 2004 වර්ෂයට පෙර සිට පැවත එන හිඟහිටි මස්කඩ කුලී ආදායම් රු.87,581ක්ව පැවතුණි.

(ආ). පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය අනුව යටත් පිරිසෙයින් පස්වසරකට වරක්වත් තක්සේරුගත බදුකුලිය සංශෝධනය කළයුතු වන අතර, අවශ්‍යතාවය මත වාර්ෂිකව වුවද, බදුකුලිය සංශෝධනය කළහැකි බව දක්වා ඇතත්, සභාව සතු

බොහෝ කඩ කාමර බදුදීමට අදාලව බදු ගැනුම්කාර පාර්ශවය සමඟ ගිවිසුම්ගතවී වර්ෂ 05 සිට 12 දක්වා කාලයක් ඉක්මවා තිබුණ ද බදු කුලී සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව සතු කඩ කාමර 93ක් බදුදීමේදී පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කර ඇති 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය අනුව ටෙන්ඩර් ක්‍රියාමාර්ග අනුගමනය කර බදුකරුවන් තෝරා ගතයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය හා බදු ගැනුම්කරු සමඟ එළඹ තිබුණු ගිවිසුම පරිදි බදු ගැනුම්කාර පාර්ශවය විසින් දේපළ විකිණීම, පැවරීම හෝ අතුරු බදුදීම නොකළ යුතු අතර, එවැනි අවස්ථාවකදී දේපළ ප්‍රාදේශීය සභාව වෙත පවරාගත යුතු බව දක්වා ඇතත්, එම රෙගුලාසිවලට පටහැනිව කඩ කාමර 40ක් බදු ගැනුම්කරුවන් විසින් විවිධ පාර්ශවයන්ට අතුරු බදු දී ඇති බවක් නිරීක්ෂණය විය.

(ඉ) එක් එක් වෙළඳ සංකීර්ණවල කඩකාමර බදු කුලිය රු.500 සිට 2,700 අතර මුදලකට තක්සේරු කර බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ එකී බදු ගැනුම්කාර පාර්ශවයන්ගෙන් සභාව බදුකුලී අයකර ගතයුතු වුවද, එකී බදු ගැනුම්කාර පාර්ශවය යථෝක්ත කඩ කාමර රු.3,500 සිට රු.15,000 අතර මුදලකට වෙනත් පාර්ශවයන්ට බදු දී තිබුණු බව නිරීක්ෂණය විය.

2.3.4 බලපත්‍ර ගාස්තු

(අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 152(4) වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කර බලපත්‍ර ගාස්තු අයකර ගතයුතු වුවද, එසේ නොකිරීම නිසා වර්ෂ ගණනක සිට දිගින් දිගටම පැවත එන රු.691,370ක හිඟහිටි වෙළඳ බලපත්‍ර ගාස්තු අයවී නොතිබුණි.

(ආ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 67 රීතිය අනුව වාර්ෂිකව කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පැවැත්විය යුතු අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය ප්‍රකාර කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර, වෙළඳ බලපත්‍ර ගාස්තු අයකළ යුතු වුවද, ඒ අනුව සමීක්ෂණයක් පැවැත්වීමකින් තොරව වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර තිබුණි.

2.3.5 වෙනත් ආදායම්

ගලේවෙල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති හෝටලයකින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන පරිදි ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 8,648,358 |
| (ii). | මුද්දර ගාස්තු | 3,210,940 |

2.4 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළ පනවන ලද අධිභාරවලට අදාලව 2012 දෙසැම්බර් 31 දිනට රු.76,000ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

2.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

නිශ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවති වටිනාකම රු.1,906,390ක් වූ භෞතික සම්පත් විෂයයන් 26ක් නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

2.6 අවිධිමත් ගනුදෙනු

(අ). නිල ඇඳුම් දීමනාව ලබා ගැනීමට හිමිකමක් නොමැති, සභා කාර්යාලයේ සේවය කරන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරින් 09 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී රු.17,541ක් වැයකර නිල ඇඳුම් ලබාදී තිබුණි.

(ආ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) වගන්තියේ විධිවිධාන වලට පටහැනිව පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව සේවකයින් 28 දෙනෙකු ආදේශක පදනම මත බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු.4,141,176ක වැටුප් ගෙවා තිබුණි.

2.7 කොන්ත්‍රාත් පරිපාලනය

විවිධ ප්‍රතිපාදන හා ප්‍රදාන යටතේ ඉටුකරන ලද මාර්ග ඉදි කිරීම් විෂයයන් 05 ක් වෙනුවෙන් එකතුව රු.2,297,578 ක්වූ වියදම් තිබුණි. මෙම ඉදිකිරීම් නියමිත ප්‍රමිතීන්ට අනුව සිදුකර නොතිබුණු බව අදාළ ඉදිකිරීම් සම්බන්ධව සිදු කළ භෞතික පරීක්ෂණයන්හිදී අනාවරණය විය. විස්කර පහත දැක්වේ.

| | ඉදිකිරීම් විෂයය | ප්‍රතිපාදනය / ප්‍රදානය | වැයකළ මුදල රු. |
|---|---|---|---|
| (i) | ඉබ්බන්කටුව ජන උදානගම රවුම් පාර කුට්ටිගල් ඇතිරීම | පළාත් සභා ප්‍රතිපාදන 2012 | 130,569 |
| (ii) | තෙන්නකෝන් පුර පන්සල පාර කුට්ටිගල් ඇතිරීම | ගම නැගුම ප්‍රතිපාදන 2012 | 1,063,718 |
| (iii) | රංකිරිගොල්ල පාර කොන්ක්‍රීට් කිරීම | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2012 | 428,227 |
| (iv) | ඇතාබැඳිවැව මාර්ගයේ බොරළු කන්ද පාර සංවර්ධනය කිරීම | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2012 | 170,000 |
| (v) | පුවක් පිටිය ගමමැද පාර සංවර්ධනය කිරීම | මග නැගුම සංවර්ධනය ප්‍රදාන 2012 | 505,064 |
| | | | 2,297,578 |

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 207 හා 208 රීති හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:4 හා 6:3ට අනුව පොදු තරඟකාරී පදනමක් අනුගමනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 44කදී රු.802,475ක වටිනාකමට භාණ්ඩ හා සේවා මිලදීගෙන තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව සභාව සතු පුස්තකාල 06කට අදාල රු.30,915ක් වටිනා පොත් 168ක ඌනතාවයක් අනාවරණය වී තිබුණද, ඒ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පෙර ගෙවුම් ශේෂවල වටිනාකම රු.3,381,897ක් වූ අතර, සභාව ස්ථාපනය කළ කාලයේ සිට ඉදිරියට ගෙන එන මෙම ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ). 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය අනුව සැලසුම් අනුමත කළ, නිවාස ඉදිකිරීමෙන් පසු ඒ නිවාසවල පදිංචි වීමට පෙර අනුකූලතා සහතික ලබාගත යුතු වුවත්, සභාව විසින් 2010, 2011 හා 2012 වර්ෂවල අනුමත කළ ගොඩනැගිලි සැලසුම් අයදුම්පත්‍ර 154කින් අයදුම්පත්‍ර 141ක් සඳහා අනුකූලතා සහතික නිකුත්කර නොතිබුණි.

(ඉ). මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ 1995 දෙසැම්බර් 27 දිනැති අංක 95/9 දරන මධ්‍යම පළාත් ගිණුම් චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ පියවා ගැනීමට අවශ්‍ය සියළු පියවර නිලධාරියා අවසන් වරට සේවය කළ ආයතනය විසින් ගතයුතු වුවද, සභාවේ සේවය කර විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය නිලධාරින් 08 දෙනෙකුගෙන් 1979 වර්ෂයේ සිට අයවිය යුතුව පැවති රු.28,740ක හිඟ ණය ශේෂ අයකර ගැනීමට විගණන දිනය වූ 2013 ජූනි 06 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

2.9 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා සභාව වෙත 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා මධ්‍යම පළාත් සභාව යටතේ රු.5,927,470ක ප්‍රතිපාදන මත අර්ධ ස්වායු ආවරණ අගල් ක්‍රමය මගින් ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කරනු ලබයි. මෙම පද්ධතිය වැසි ජලය බැස යන පහත් බිම් ප්‍රදේශයක ඉදිකර ඇති බැවින් වැසි ජලය රැස්වී මදුරුවන් බෝවන ස්ථානයක් බවට පත්වී තිබුණු අතර, බැහැරින් ගෙනෙන ලද පොලිතින් හා වෙනත් නොදිරන අපද්‍රව්‍ය

ක්ෂේත්‍රය අවට ගොඩගසා තිබූ බව 2012 නොවැම්බර් 22 දින කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදී අනාවරණය විය.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). වත්කම් කළමනාකරණය

(ඈ). කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) ගබඩා පාලනය